283 අනුක්‍රමික වර්ගය (ST283) හා සම්බන්ධ ආක්‍රමණික බී කාණ්ඩයේ ස්ට්‍රෙප්ටොකොකස් ආසාදනය

2021 ඔක්තෝබර් 26

## රෝග කාරකය

බී කාණ්ඩයේ ස්ට්‍රෙප්ටොකොකස් (GBS) හෙවත් *ස්ට්‍රෙප්ටොකොකස් ඇගලැක්ටියේ (Streptococcus agalactiae)* යනු සංවෘත, ග්‍රෑම්-ධන, චංචල නොවන කොකස් බැක්ටීරියාවකි. එය මිනිසුන්, ක්ෂීරපායී සතුන්, උභයජීවීන්, උරගයින් සහ මසුන් ඇතුළු විවිධ විශේෂ අතර බහුලව පැතිරෙනු ලැබේ. GBS හි සුවිශේෂ වික්‍රියාවක් වන 283 අනුක්‍රමික වර්ගය (ST283) වඩාත් ප්‍රබල වික්‍රියා අතර තිබූ අතර, එය බොහෝ නිරෝගී වැඩිහිටියන් හෝ කැපී පෙනෙන බහුවිධ රෝගාබාධ සාපේක්ෂව අඩු වැඩිහිටියන්හට ආක්‍රමණික රෝග ඇති කළේය.

අග්නිදිග ආසියාතික රටවල මිරිදිය මත්ස්‍යයන් තුළ, විශේෂයෙන් වගා කරන ලද මසුන් තුළ GBS ST283 පවතින බව වාර්තා වූයේ, එය 12.5% සිට 100% දක්වා පරාසයක පැතිර ඇති බවට වාර්තා කරමිනි.
2015 දී සිංගප්පූරුවේ අවම වශයෙන් පුද්ගලයින් 146 දෙනෙකු ඇතුළත් වූ, මහා පරිමාණවූත් ආක්‍රමණශීලීවූත් ආහාර හේතුවෙන් ඇතිවූ රෝග ව්‍යාප්තියක් GBS ST283 විසින් ඇති කරන ලදී. වසංගත රෝග විද්‍යා පරීක්ෂණවලින් පෙනී ගියේ මෙම ව්‍යාප්තිය අමු මිරිදිය මාළු පරිභෝජනය සමඟ ප්‍රබල සම්බන්ධයක් ඇති බවත් මෙය 2015 දෙසැම්බර් මාසයේ සිට සිංගප්පූරුවේ නොපිස ආහාරයට ගන්නා සියලුම අමු මිරිදිය මාළු භාවිතය තහනම් කිරීමට හේතු වී ඇති බවත්ය. අනතුරුව, GBS ST283 රෝගය මහජන චීන සමූහාණ්ඩුව, හොංකොං චීන විශේෂ පරිපාලන කලාපය, ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, තායිලන්තය සහ වියට්නාමය ඇතුළු අග්නිදිග ආසියාවේ සහ ඒ අවට අනෙකුත් රටවල සහ ප්‍රදේශවල ද වාර්තා වී ඇත.

## සායනික රෝග ලක්ෂණ

ආක්‍රමණික GBS ආසාදනය සෙප්සිස්, මෙනින්ජයිටිස්, සෙප්ටික් ආතරයිටිස්, ආසාදිත එන්ඩොකාර්ඩයිටිස් ලෙස පැවතිය හැකි අතර මරණය පවා ඇති කළ හැකි ය.

## සම්ප්‍රේෂණය වන ආකාරය

ST283 හා සම්බන්ධ ආක්‍රමණික බී කාණ්ඩයේ ස්ට්‍රෙප්ටොකොකල් ආසාදනයේ ප්‍රභවයන් බොහෝ දුරට අපැහැදිලි ය. එය සකලංක ආහාර අනුභව කිරීම හෝ අනිසි ලෙස පරිහරණය හා සම්බන්ධ බව විමර්ශනයන් වාර්තා කළ අතර සමහරක් වාර්තා කළේ බී කාණ්ඩයේ ස්ට්‍රෙප්ටොකොකස් ST283 මිරිදිය මත්ස්‍යයන්, විශේෂයෙන්ම වගා කළ මසුන් තුළ පවතින බවයි.

## අධි අවදානම් කණ්ඩායම්

පොදුවේ ගත් කල වැඩිහිටියන් හා ප්‍රතිශක්තිකරණය අඩු පුද්ගලයන්හට වැඩි අවදානමක් ඇත.

## කළමණාකරනය

ආක්‍රමණශීලී බී කාණ්ඩයේ ස්ට්‍රෙප්ටොකොකස් ආසාදනය සඳහා ප්‍රතිජීවක ඖෂධ භාවිතයෙන් ප්‍රතිකාර කළ හැකිය.

## වළක්වා ගැනීම

ST283 හා සම්බන්ධ ආක්‍රමණශීලී බී කාණ්ඩයේ ස්ට්‍රෙප්ටොකොකස් ආසාදනය වළක්වා ගැනීම සඳහා පුද්ගලික, ආහාර සහ පාරිසරික සනීපාරක්ෂාව පවත්වා ගැනීමට මහජනතාවට මතක් කර දෙන අතර සෑම විටම තම දෑත් පිරිසිදුව තබාගෙන හොඳින් තුවාලවලට සත්කාර කළ යුතුය, විශේෂයෙන්ම:

•ජලජ නිෂ්පාදන හෝ ආපනශාලාවල සේවකයින් ජලජ නිෂ්පාදන හැසිරවීමේදී අත්වැසුම් පැළඳිය යුතු අතර ජලජ නිෂ්පාදන හෝ අපිරිසිදු ජලය නිරාවරණය වූ දෑතින් සෘජුව ස්පර්ශ කිරීමෙන් වැළකී සිටිය යුතු ය

• වෙළෙඳ පොළෙන් මාළු මිලදී ගැනීමේදී මාළු ඇල්ලීම හෝ වෙළෙඳසල්වල සපයා ඇති කිසිදු තුවායක් භාවිත කිරීම හෝ නොකළ යුතු ය. නොපිසින ලද ජලජ නිෂ්පාදන ස්පර්ශ කළේ නම් හැකි ඉක්මනින් දියර සබන් යොදා ජලයෙන් අත් සෝදන්න

• නිවසේදී ජලජ නිෂ්පාදන හැසිරවීමේ දී අත්වැසුම් පළඳින්න, ජලජ නිෂ්පාදන හැසිරවීමෙන් අනතුරුව අත් හොඳින් සෝදන්න

• කිසිදු මිරිදිය මත්ස්‍ය සෂිමි, අමු හෝ නොපිසූ මිරිදිය ජලජ නිෂ්පාදන අනුභව නොකළ යුතුය. අවම වශයෙන් තත්පර 15ක්වත් පිස ගැනීම සඳහා ආහාරයේ මැද හෝ ඝනම කොටස අංශක 75ක උෂ්ණත්වයකට ළඟා විය යුතු ආහාර හොඳින් පිසූ බව සහතික කර ගන්න. (රෝගකාරක විනාශ වන පරිදි) හෝ ආහාර හොඳින් පිසින ලද බව සහතික කර ගන්න.

•අත්වල තුවාල ඇති විට ජලජ නිෂ්පාදන සෘජුවම ස්පර්ශ නොකළ යුතුය. ජලජ නිෂ්පාදන හැසිරවීමේදී තුවාලයක් සිදුවුවහොත්, තුවාලය වහාම පිරිසිදු කර ජලය කාන්දු නොවන ඇලවුම් පටිවලින් ආවරණය කළ යුතුය. තුවාලය ආසාදනය වූයේ නම් වහාම වෛද්‍ය උපදෙස් ලබාගන්න